
WWW.OLEVELAPI.COM

අවසන් සංශෝධන ඇතුලත් කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය
## 2010

## ලකුණු දීමේ පටිපාටිය



## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

මෙය උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. ප්‍රධාන පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි ඇතැම් වෙනස්කම් කරනු ලැබේ. මෙය පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා ආධාරකයක් ලෙසද යොදා ගතහැකිය.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## උත්තර පත්‍ර ලකුණු කිරීම - පොදු ශිල්පීය ක්‍රම

පිළිතුරු පත් ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළයුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

- උත්තර පත්‍ර ලකුණු කිරීමට රතුපාට පැන්සලක් හෝ රතු පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
- සෑම උත්තර පත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී පහත සඳහන් ක්‍රමය අනුගමනය කරන්න.

1 2 3 4 5 6 7 8 9 0

- ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

### බහුවරණ උත්තර පත්‍ර - කවුළු පත්‍රය

ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය පිළිතුරු පත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොද අනුමත කර ගන්න.

අනතුරුව උත්තර පත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපීයන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලිව එය මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

කවුළු පත්‍රය පිළිතුරු පත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර X ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා $\frac{60}{100}$ $\frac{20}{30}$

WWW.OLEVELAPI.COM

### ව්‍යුහගත රචනා හා රචනා උත්තර පත්‍ර

- අයදුම්කරුවන් විසින් උත්තර පත්‍රයේ හිස්ව තබා ඇති කොටස් හෝ පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

- ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොද ගත යුතුවේ.

කිසියම් අයදුම්කරුවකු විෂයට නියමිත ප්‍රශ්න පත්‍ර එකකට (ප්‍රශ්න පත්‍ර තුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) පමණක් පෙනී සිටි අවස්ථාවක දී ඉතිරි ප්‍රශ්න පත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රයන්ට මුහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම් නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතුය.

උදාහරණ : - මුළු ලකුණු 100

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

| අවසාන ලකුණු | මුළු ලකුණු | I පත්‍රය 40 | II පත්‍රය 60 |
|---|---|---|---|
| 44 | 44 | AB | 44 |

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 200 | I පත්‍රය 100 | II පත්‍රය 100 |
|---|---|---|---|
| 31 | 62 | 62 | AB |

අවසාන ලකුණු තීරණය කළ නොහැකි අවස්ථා:-

කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ අදාල උත්තර පත්‍ර පැකට්ටුව I හා II සියල්ලම ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති නම් අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.
(උදා - ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරණ විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකැට්ටුව පමණි.)
කිසියම් අයදුම්කරුවකුගේ උත්තර පත්‍ර I හෝ II හෝ III පැකට්ටුව තුළ නොමැති අවස්ථාවක දී හා ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන් කර නොමැති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

කිසියම් අයදුම්කරුවකුගේ උත්තර පත්‍රයේ සඳහන් විභාග අංකය හා ලකුණු ලැයිස්තුවේ සඳහන් විභාග අංකය නොගැළපෙන අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

කිසියම් මධ්‍යස්ථානයක සියලුම අයදුම්කරුවනට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

උදා - ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන කඩදාසි දෙකකින හෝ කීපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා

**මෙවැනි අවස්ථාවලදී**

අවසාන ලකුණු තීරණය නොකර ලකුණු ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ අයදුම්කරුගේ විභාග අංකය ලියා "අවසාන ලකුණු තීරණය කළ නොහැක" යන සටහන යොදන්න. මෙම සටහන උත්තර පත්‍රයේ මුල් පිටුවේ පහළ කෙළවරේ ද යොදන්න. මේ පිළිබඳව ජර්නල් සටහනක් යොදන්න.

මෙවැනි අයදුම්කරුවන් පිළිබඳ මධ්‍යස්ථාන අනුව වෙන් වශයෙන් "9" අයිටම්වල් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න.

මෙම ලකුණු ලැයිස්තු "9" අයිටම්වල් (9IML) සටහන තුළ බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

කොටස් සඳහා දෙන ලකුණු ඒ ඒ කොටස අවසානයේ භාග සංඛ්‍යාවක් ලෙස දක්වන්න. උත්තරයකට ලැබුණු මුළු ලකුණු ලිවීමේ දී එක් එක් කොටස සඳහා ලැබුණු ලකුණු උත්තරය අවසානයේ නැවත ලියා ඒවා එකතු කොට දක්වා ඒ වටා කවයක් අඳින්න. නිදසුනක් වශයෙන් ප්‍රශ්න අංක 03 කොටස් තුනකින් යුක්ත නම් හා එක් එක් කොටසට හිමි උපරිම ලකුණු ප්‍රමාණය 05 නම්, ඒ අනුව අයදුම්කරු ලබා ඇති ලකුණු මෙසේ දැක්විය යුතුය.

$$\frac{4}{5} + \quad ii\ \frac{3}{5} + \quad iii\ \frac{3}{5} = 3 \text{ ——— } \left(\frac{10}{15}\right)$$

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

සෑම උත්තරයකට ම දෙන මුළු ලකුණු උත්තර පත්‍රයේ මුල් පිටුවේ ඇති අදාල කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම සලකුණුවේ. සියල්ලම ලකුණු කොට ලකුණු මුල් පිටුවේ සටහනක් කර අවසානයේ දී අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

පරීක්ෂකවරිට මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තර පත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තර පත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මුල් පිටුවේ එකතු කර ඇති මුළු ගණනට සමානදැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න ප්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න. (ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශත සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)

**අවසාන ලකුණු තීරණය කිරීම**

දින පැකැට්ටුවට අදල සියලු ම උත්තර පත්‍ර එනම් I හා II (ඇත්නම් III ) උත්තර පත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තර පත්‍රවලට අදල ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මුල් පිටුවේ සටහන් කරන්න.

උදාහරණ :-

| (අ) | (ආ) | ඇ |
|---|---|---|
| (i) $\frac{54}{100}$ | (i) $\frac{22}{40}$ | (i) $\frac{60.5}{100}$ |
| (ii) $\frac{67}{100}$ | (i) $\frac{34}{60}$ | (i) $\frac{81}{100}$ |
| (iii) $\frac{36}{100}$ | | |
| 3 \| 157 | | 2 \| 141.5 |
| 52.33 | | 70.75 |
| 52% | 56% | 71% |

ඉහත උදාහරණවලින් දක්වන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවල දී අවසාන ලකුණ පමණක් පූර්ණ සංඛ්‍යා ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දක්වීමේ දී ඉතිරිය 05 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට නැමිණ විය යුතුය. ඉතිරිය 0.5ට අඩුනම් නොසලකා හැරිය යුතුය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**

**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2010**
**21 - සිංහල භාෂාව හා සාහිත්‍යය I, II, III**

අවසාන ලකුණු ගණනය

I පත්‍රය ලකුණු 40 යි

II 1 වන ප්‍රශ්නය - ලකුණු 20 යි.
2 වන ප්‍රශ්නය - ලකුණු 25 යි.
3 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
4 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
5 වන ප්‍රශ්නය - ලකුණු 15 යි ලකුණු 80 යි

III 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්යයි. 5, 6 සහ 7 වන ප්‍රශ්නවලින් එකකට පිළිතුරු ලිවිය යුතුය.

1 වන ප්‍රශ්නය - ලකුණු 20 යි.
2 වන ප්‍රශ්නය - ලකුණු 20 යි.
3 වන ප්‍රශ්නය - ලකුණු 15 යි
4 වන ප්‍රශ්නය - ලකුණු 15 යි
5 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
6 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
7 වන ප්‍රශ්නය - ලකුණු 10 යි ලකුණු 80 යි

WWW.OLEVELAPI.COM

එකතුව ලකුණු $\frac{200}{2}$ යි

අවසාන ලකුණු **100**

දෙවන හා තුන්වන පත්‍රවල ලකුණු දැමීම.

1. කොටස් ලකුණු, දකුණු පස ඇති තීරුවෙහි ලියා දක්වන්න.

2. ඒ ඒ ප්‍රශ්නයෙහි කොටස්වලට ලද ලකුණු උත්තරයේ අග ලියා එකතු කොට එය දකුණු පස තීරුවේ ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා :- $\frac{4}{8}$ $\frac{6}{12}$ $\frac{3}{5}$ (2 - $\frac{13}{25}$)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**අවසාන ලකුණු ඇතුළත් කිරීම.**

රතු ලකුණු ලැයිස්තු යොදා ගන්නා විට එහි දක්වෙන මුළු ලකුණු වන 300 යන්න වෙනස් කොට 200 සේ ලියා ගන්න.

**රතු ලකුණු ලැයිස්තු නොමැති විට අවසාන ලකුණු ඇතුළත් කිරීම.**

I ,II යන පත්‍රවල ලකුණු ඇතුළත් කිරීම සඳහා යොදා ගත යුත්තේ තුන්වන පත්‍රය සඳහා ඇති ලකුණු ලැයිස්තුව ය.

ලකුණු ලැයිස්තුවේ දක්වෙන අංක 12 තීරුව 3 වන පත්‍රයේ මුළු ලකුණු ගණන ඇතුළත් කිරීමට යොදා ගන්න. පත්‍ර තුනෙහි ම ලකුණුවල එකතුව එහි මුළු ලකුණු (200) තීරුවේ ද අවසාන ලකුණු (100) තීරුවේ ද සටහන් කරන්න.

**විශේෂ අවස්ථා**

තුන්වන පත්‍රය සඳහා ලකුණු ලැයිස්තු සපයා නොමැති නම් ඇගයීම් මධ්‍යස්ථානයෙන් අතිරේක ලකුණු ලැයිස්තු ලබා ගෙන III පත්‍රයේ ලකුණු එහි ඇතුළත් කරන්න.

එවැනි අවස්ථාවල දී I ,III පත්‍රවල මුළු ලකුණු II පත්‍රය සඳහා ඇති විස්තර ලකුණු ලැයිස්තුවේ ඇතුළත්කොට අවසාන ලකුණු ගණන 100 තීරුවේ ලියන්න. .

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## I පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

1. ලකුණු කිරීම සඳහා ඔබ පිළියෙල කර ගන්නා කවුළුපත ප්‍රධාන පරීක්ෂක ලවා සහතික කරවා ගන්න.

2. පළමුවෙන් ම උත්තර පත්‍රය පරීක්ෂා කර එක් එක් ප්‍රශ්නයක් සඳහා පිළිතුරු එකකට වඩා ලකුණු කොට ඇත්නම් හෝ ලකුණු කොට නැත්නම් හෝ වරණ හරහා කැපී යන සේ ඉරක් අඳින්න.

3. සෑම උත්තරයක් ම හරි බව හෝ වැරදි බව හෝ පැහැදිලිව ම අදාළ ප්‍රශ්න අංකය මත ම ලකුණු කරන්න.

4. අපේක්ෂකයා ලකුණු කර ඇති පිළිතුරු මත හරි වැරදි ( √ / x ) ලකුණු නොදමන්න.

5. කවුළු පතේ ප්‍රශ්න අංක තීරය කවුළුවක් වන සේ කපා හැර එම තීරුවෙහි ම හරි හෝ වැරදි බව දක්වන්න.

6. කවුළු පතක් හෝ තීරු පතක් හෝ යොදා ගන්නා විට නිවැරදි පිහුම ගැන විශේෂයෙන් පරිස්සම් වන්න.

7. එක් එක් තීරුවෙහි නිවැරදි උත්තර සංඛ්‍යාව පහළට එකතු කොට ඒ ඒ තීරුවේ ම යටින් ලියා ඒවා එකතු නිවැරදි පිළිතුරු ගණන $\frac{xx}{40}$ යි. දකුණු පස අදාළ කොටුව තුළ ලියන්න.

8. ලකුණු එකතු කිරීම, එම මුළු ලකුණු 3 වන පත්‍රයේ සටහන් කිරීම යන අවස්ථාවල දී බෙහෙවින් පරීක්ෂාකාරී වන්න.

9. ආදි ලකුණකින් උත්තර ලකුණු කර තිබුණ ද, උත්තර දීම සඳහා විශේෂ පත්‍රිකාව භාවිත නොකොට ප්‍රශ්න පත්‍රයෙහි ම ඉරි ඇඳීම ආදි වශයෙන් ලකුණු කොට තිබුණ ද පිළිගන්න.

---

## II, III පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

1. උත්තර පත්‍ර ඇගයීම ආරම්භ කිරීමට පෙර එක් එක් ප්‍රශ්නයකින් සක්සෙරු කිරීමට අපේක්ෂා කරන හැකියාව කවරේ දැයි හොඳින් අවබෝධ කර ගත යුතුය.

2. එම හැකියා සම්බන්ධයෙන් අපේක්ෂකයා ප්‍රදර්ශනය කළයුතු ප්‍රවීණතා මට්ටම කුමක් ද යන්න අනුහුරු අභ්‍යාස කිරීමේ අවස්ථාවේදීත් ලකුණු දීමේ පටිපාටිය සාකච්ඡා කරන අවස්ථාවේදීත් පැහැදිලිව හඳුනා ගැනීම අවශ්‍ය වේ. මෙහි දී ප්‍රදර්ශනය විය යුත්තේ 11 වන ශ්‍රේණියේ අවසානයේ දී අපේක්ෂකයා ළඟා විය යුතු ප්‍රාප්ති මට්ටම ය. එහි දී ගුරුවරයෙකු වශයෙන් ඔබ සතු අත්දැකීම් ද ඔබගේ ප්‍රධාන පරීක්ෂකවරයා විසින් දෙනු ලබන උපදෙස් හා මග පෙන්වීම ද බොහෝ සේ ප්‍රයෝජනවත් වනු ඇත.

3. ලකුණු පැවරීමේ දී පරීක්ෂකවරුන් අතර සංගත බවක් තිබිය යුතුය. එකම උත්තරයකට පරීක්ෂකවරුන් කිහිප දෙනෙකු විසින් පවරනු ලබන ලකුණු අතර විශාල වෙනස්වීම් ඇතිවීම වළක්වා ගත යුතුය. මේ සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කිරීම මැනවි.

    (අ) ඉදිරිපත් කොට ඇති ලකුණු දීමේ පටිපාටිය එලෙස ම අනුගමනය කිරීම.
    (ආ) ප්‍රධාන පරීක්ෂකගේ උපදෙස් නිවැරදි ව වටහා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීම.
    (ඇ) විභාග දෙපාර්තමේන්තුව මගින් නියුක්ත කර ඇති අත් පොතෙහි සඳහන් ශිල්පීය ක්‍රම ඒ අයුරින් ම භාවිත කිරීම.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை

අ.පො.ස. (සා.පෙළ) විභාගය 2010
க.பொ.த.(சா.தர)ப் பரீட்சை 2010

විෂයය / பாடம் } සිංහල භාෂාව හා සාහිත්‍යය    විෂයය අංකය / பாட இலக்கம் } 21

### ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය
### புள்ளி வழங்கும் திட்டம் - பத்திரம் I

| ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 4 | 31. | 1 |
| 02. | 4 | 12. | 4 | 22. | 3 | 32. | 4 |
| 03. | 3 | 13. | 3 | 23. | 4 | 33. | 1 |
| 04. | 1 | 14. | 1 | 24. | 1 | 34. | 1 |
| 05. | 2 | 15. | 3 | 25. | 2 | 35. | 2 |
| 06. | 3 | 16. | 1 | 26. | 1 | 36. | 3 |
| 07. | 1 | 17. | 4 | 27. | 1 | 37. | 4 |
| 08. | 4 | 18. | 2 | 28. | 2 | 38. | 3 |
| 09. | 2 | 19. | 2 | 29. | 3 | 39. | 4 |
| 10. | 1 | 20. | 1 | 30. | 3 | 40. | 1 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් ප්‍රශ්නයකට / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்த புள்ளிகள் 01 x 40 = **40**

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## II පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රයේ අරමුණ වී ඇත්තේ අපේක්ෂකයා සතු

i. ලිවීමේ කුසලතා ඇගයීම

ii. කියවීමේ කුසලතා ඇගයීම

(i) ලිවීමේ කුසලතාවල දී අවධානය යොමු කර ඇත්තේ භාවිතය, විශ්ලේෂණය හා සංශ්ලේෂණය යන හැකියා තක්සේරු කිරීමටයි. දෛනික කාර්යයන්හි දී භාෂාව ප්‍රායෝගික ව යොද ගැනීමට අපේක්ෂකයාට ඇති හැකියාව විමසීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත.

එහි දී භාෂාව ප්‍රායෝගික ව පරිහරණය කිරීමටත්, අවස්ථානුරූපී ව ගැළපීමටත්, නිවැරදි ව භාවිත කිරීමටත් ඇති හැකියාව ඇගයීමට ලක් කෙරේ.

භාවිතය යන්නෙන් අදහස් කෙරෙන්නේ උගත් මූල ධර්ම අලුත් අවස්ථාවක දී නිවැරදි ව ප්‍රයෝජනයට ගැනීමයි. අක්ෂර වින්‍යාසය, පද බෙදා ලිවීම, උක්තාඛ්‍යාත පද සම්බන්ධය, ආකෘතිය ආදිය පිළිබඳ මූල ධර්ම අලුත් අවස්ථාවක දී ප්‍රයෝජනයට ගැනීම භාවිතය පිළිබඳව දැක්විය හැකි උදාහරණයකි.

විශ්ලේෂණය යන්නෙන් අදහස් කෙරෙන්නේ කිසියම් අදහසක් හෝ සිද්ධියක් හෝ ඉදිරිපත් කර ඇති කල්හි එහි සමස්තය ඇසුරින් කොටස් විග්‍රහ කොට බැලීම හා සමස්තය තුළ ඇති විවිධ උප කොටස් හඳුනා ගැනීමයි. එසේ ම එම උප කොටස් අතර සම්බන්ධය දැකීම යි.

සංශ්ලේෂණය යන්නෙන් අදහස් කරන්නේ කිසියම් සමස්තයක් ගොඩනැගීමේ හැකියාවයි. ඡේදයක විවිධ අනු කොටස් හඳුනා ගෙන, ඒ අනු කොටස් අතර නිවැරදි සම්බන්ධය පවත්වා ගනිමින් අලුත් යමක් නිර්මාණය කිරීමයි.

(ii) කියවීමේ කුසලතා ඇගයීමේ දී අවධානය යොමු කළ යුත්තේ අලුත් කොටසක් කියවා එහි ප්‍රධාන අදහස් වටහා ගැනීම, එහි එන යෙදුම්වලින් ප්‍රකාශ වන විවිධ අරුත් තේරුම් ගැනීම, එහි එන සමහර වචනවල අරුත් අවබෝධ කර ගන්නා අයුරු විමසීම වැනි කරුණු කෙරෙහිය.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය - II පත්‍රය

※ ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු ගණන 80 කි.

**ප්‍රශ්න අංක - 01** - **මුළු ලකුණු 20 යි.**

**අපේක්ෂණය** - **භාෂා පරිචය අගැයීම**

**මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ.**
**අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20 යි.**

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන පහත සඳහන් අක්ෂර කාණ්ඩ **දෙක** නම් කරන්න.
(අ) ෂ, ශ, ස, හ, ළ (ආ) ය, ර, ල, ව

(ii) මෙහි (අ), (ආ) කොටස්වල එන වාක්‍ය දෙකෙහි **තද කළු අකුරෙන්** දක්වෙන පද නිවැරදි නොවේ. එම පදය පමණක් නිවැරදිව ලියන්න.
(අ) අලුත් සහල් මංගල්‍යය අපේ **සම්ප්‍රදයික** උත්සවයකි.
(ආ) **කාර්යාලීය** කටයුතු නිසි පරිදි පිළිපැදීම රටේ දියුණුවට හේතු වේ.

(iii) පහත සඳහන් එක් එක් වාක්‍ය ඛණ්ඩය සඳහා අර්ථවත් **තනි පදය** බැගින් ලියන්න.
(අ) කිසියම් ව්‍යාපාරයක් සඳහා මුදල් යෙදවීම (ආ) වචනවල සැඟවී ඇති තේරුම

(iv) මෙහි (අ), (ආ) වාක්‍යවල යෙදී ඇති කලාපය යන වචනයට තේරුම් දෙකක් ඇත. ඒ තේරුම් **දෙක** වෙන් වෙන් ව ලියන්න.
(අ) පහරුවේ දෙවන **කලාපය** දැන් නිකුත් වී ඇත.
(ආ) දකුණු ආසියානු **කලාපය** දියුණුවෙමින් පවතී.

(v) පහත දැක්වෙන (අ), (ආ) යෙදුම්වල පළමුවැනි පදය සමග දෙවැනි පදයෙහි නොගැළපීමක් ඇත. වචනේ ගැළපෙන සේ පළමුවැනි පදය සකස්කර ලියන්න.
(අ) කනිටු පාඨශාලාව (ආ) සතුන් සංහතිය

(vi) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය දෙක කර්ම කාරක වාක්‍ය බවට හරවා ලියන්න.
(අ) ගුරුවරු විභාග ශර්‍යක සිසුයන් අගය කරති.
(ආ) ගොවියා වගා හානි කරන කිරුවන් මර්දනය කළේ ය.

(vii) පහත දී ඇති කවිපෙළ දෙකෙහි **තද කළු අකුරෙන්** දැක්වෙන පද විග්‍රහය නම් කරන්න.
(අ) 'ඒ පාසන් ඉරිදා පොළට **ඇතුළු** වරමිනෙත' (ආ) 'බැඳි දද **එළි** අරුණලු නැගී පෙරමරට'

(viii) පහත (අ), (ආ) කොටස්වල දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් තනි පදයක් ලියන්න.
(අ) වෛකල්පික (ආ) සංශ්ලේෂණය

(ix) වරනි සම්මන්ත්‍රණය හා බැඳී ඇති පහත සඳහන් පදවල අදහස ලියන්න.
(අ) කාවුල්ල (ආ) බිසෝකොටුව

(x) 'කල්කිරියාට කොඳයි' යන යෙදුමෙන් යමකුගේ යහපත් හැසිරීම අදහස් වේ. ඒ අනුව පහත සඳහන් යෙදුම්වල අදහස ලියන්න.
(අ) කල්පල් මැඩීම (ආ) කල් මැරීම (ලකුණු 20 යි.)

**අපේක්ෂිත උත්තර**

I (අ) ඌෂ්මාක්ෂර / ඝර්ෂ /
(ආ) අර්ධ ස්වර / අන්තඃස්ථ / අන්තඃස්ථාක්ෂර

II (අ) සාම්ප්‍රදායික
(ආ) කාර්යාලයීය/කාර්‍යාලයීය/ කාර්‍යාලයීය/ කාර්යාලීය/කාර්‍යාලීය/ කාර්‍යාලීය
(නිවැරදි වචනය සහිත වාක්‍යය ම ලියා තිබුණත් ලකුණු දෙන්න.)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

III (අ) ආයෝජනය
(ආ) වචනාර්ථය/ ධ්වනිතාර්ථය/ ලක්ෂණාර්ථය

IV (අ) කාණ්ඩය/ වෙළුම/ කලඹ/ කලඹ/ අංකය
(ආ) ප්‍රදේශය

V (අ) කනිෂ්ඨ පාඨශාලාව
(ආ) සත්ත්ව සංහතිය/ සත්ව සංහතිය

VI (අ) ගුරුවරුන් විසින් විනය ගරුක ශිෂ්‍යයෝ අගය කරනු ලබති/ අගය කෙරෙති/ අගය කෙරෙත්/ අගය කරනු ලබත්/ අගය කරනු ලැබෙත්/ අගය කරනු ලැබෙති/ අගයෙති

(ආ) ගොවියා විසින් වගා හානි කරන සිවාවෝ මර්දනය කරන ලදහ/ කරනු ලැබූහ/ කරනු ලැබූවෝය/ කරන ලද්දාහ/ කරන ලද්දෝය/ කෙරුණු/ කෙරුණාහ/ කරන ලදු.

VII (අ) කෘදන්ත/ ක්‍රියානාම/ ප්‍රත්‍යයාර්ථ නාම/ [illegible]/ අතීත කෘදන්ත
(ආ) නිපාත/ අව්‍යය

VIII (අ) අභිවාදය/ [illegible]
(ආ) විශ්ලේෂණය

IX (අ) වැව ඉස්මත්ත/ වැවේ ඉහළ කොටස/ වැවේ ඉහළ ප්‍රදේශය/
(ආ) ~~ජල පාලන මධ්‍යස්ථානය~~/ සොරොව්වෙන් ගලන ජලය පාලනය කරන ස්ථානය/

X (අ) සුදුසු/ යෝග්‍ය/ උචිත/ කැළපෙන කාලය (අවස්ථාව) බැලීම/ බලා සිටීම/
(ආ) කාලය ගෙවමින් සිටීම/ නිකරුණේ කාලය කාදැමීම/ කාලය නාස්ති කිරීම/

**ප්‍රශ්න අංකය - 02 - මුළු ලකුණු 25 යි.**

**අපේක්ෂණය - සංනිවේදන හැකියාව මැනීම.**

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් පරීක්ෂකයාට ඉදිරිපත් කොට ඇති මඟ පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරින් වටහා ගත යුතුය. රචනයෙහි විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකිය. මාතෘකාවක් ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරින් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.

02. පහත දැක්වෙන (i), (ii), (iii), (iv) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන, වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න.

පහත දැක්වෙන එක් එක් විස්තරයට මුලින් වරහන් තුළ ඇති රෝම ඉලක්කම, ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද ලියන්න.

* අන්තර්ගත විය යුතු කරුණු
* ඡේද සංඛ්‍යාව
* කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
* යොදා ගත හැකි මාතෘකාව

ආදිය පිළිබඳ ව මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(i) ගැමි පරිසරය සමඟ බැඳුණු සිංහල සංස්කෘතිය හා සාරධර්ම ශ්‍රී ලාංකේය අනන්‍යතාව හඳුන්වා දෙයි. සංවර්ධන ඉලක්ක කරා යාමේ දී සිදු වන නාගරීකරණය නිසා මෙම උසස් ගුණාංග ක්‍රමයෙන් අභාවයට යමින් පවතී. මේවා ආරක්ෂා කර ගැනීමට පෙළ ගැසීම අප හැමගේ වගකීමකි.

(ii) ජංගම දුරකථන භාවිතය මේ වනවිට බොහෝවින් ව්‍යාප්ත වී ඇත. ගෝලීයකරණයත් සමඟ ඇති වී තිබෙන නව විප්ලවය තුළින් සන්නිවේදන කාර්යය පහසු කිරීමේ ලා මෙවැනි නව තාක්ෂණික මෙවලම් මහෝපකාරී වේ. එහෙත් ඒවා අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම අහිතකර අවස්ථා ඇති ද නිතර අසන්නට ලැබේ.

(iii) ළමයින් උදෙසා ද චිත්‍රපට නිෂ්පාදනය කිරීමට ලොව දියුණු රටවල් පෙළඹී ඇත්තේ ළමා ආකල්ප සංවර්ධනය රටක ඉදිරි පැවැත්මට අත්‍යවශ්‍ය ම අංශයක් ලෙස සැලකීමෙනි. එහෙත් ශ්‍රී ලංකාව තවමත් ඒ පිළිබඳ ව වැඩි අවධානයක් යොමුකර ඇති බවක් නොපෙනේ. රටක ජීවනාලිය බඳු ළමා පරපුර වෙනුවෙන් චිත්‍රපට නිෂ්පාදනයට යොමුවීම වර්තමාන යුගයේ අවශ්‍යතාවකි.

(iv) රටවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සඳහා රෝගවලට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට සෑම රටකට ම සිදු වේ. රෝග සඳහා පිළියම් යොදන අතර ම රෝගවලින් ආරක්ෂා වීමේ අවශ්‍යතාව පිළිබඳ ව ද සියලුදෙනා ම අවධානය යොමු කළ යුතු ය. සෞඛ්‍යසම්පන්න පුරවැසියන් වෙසෙන රටක රෝග ප්‍රතිකාරය මෙන් ම නිවාරණය ද එක සේ වැදගත් වේ. (ලකුණු 25 යි.)

**එක් එක් විස්තරයට අදාළ වන්නේ පහත සඳහන් මූලය අදහස් ය.**

**I සංස්කෘතිය හා සාරධර්ම රැකගනිමු**

**II ගෝලීයකරණය හා සන්නිවේදනය**

**III ආකල්ප සංවර්ධනයට ළමා චිත්‍රපටවල දායකත්වය**

**IV සෞඛ්‍ය සම්පන්න පරපුරක් උදෙසා රෝග නිවාරණයේ වැදගත්කම**

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි.**

| | | | |
|---|---|---|---|
| 1. | සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08 යි |
| 2. | සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වියත්වය | - | ලකුණු 12 යි |
| 3. | භිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05 යි |

WWW.OLEVELAPI.COM

01. සාරවත්භාවය - ලකුණු 07 යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි

තේමාවට අදාළබව, ඉදිරිපත් කොට ඇති විග්‍රහයට සම්පබව, සරළබව හා සමබව, වචන ගණන 250 සීමාව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වියත්වය - ලකුණු 12 යි

මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය සංවිධානය, ස්වියත්වය නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. භිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම. - ලකුණු 05 යි

වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**සැලකිය යුතුයි**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200 ට වඩා අඩු වන කල්හි ඉහත දැක් වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (×) ලකුණ යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් පැහැදිලි ලෙස ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.

1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තර අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

| | | | | |
|---|---|---|---|---|
| නිදසුන් | 6 | 9 | 3 | 18 |
| | -- | -- | -- | -- |
| | 8 | 12 | 5 | 25 |

**සංලක්ෂ්‍යය :** වාක්‍ය රචනය ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස්කර ගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාර්ථකත්වය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

**ප්‍රශ්න අංකය - 03**

**අපේක්ෂණය -** කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒවා ඇසුරින් සමස්ත පරිච්ඡේදය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී අගයේ. එසේ ම සංක්ෂේපණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

3. පහත දැක්වෙන ඡේදය වචන *50-55* අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියන්න.

රටක් සංවර්ධනය වීමේ දී මිනිසුන්ට ලැබෙන ආදායම් මට්ටමෙන් ඉහළ යයි. එක් අතකින් පුද්ගලයන් වෙනුවෙන් දැරිය යුතු සාමාන්‍ය වියදම් වැඩි වේ. ලංකාව වැනි රටවල ජනයාගේ ජීවන මට්ටම ඉහළ ගියා යුත කාර්ය, වියදම් ක්‍රමයෙන් වැඩි වෙයි. අනික් අතින් කර්මාන්ත සහ වෙනත් ව්‍යාපාර වෙනුවෙන් වූ ප්‍රාග්ධන අවශ්‍යතා පිරිමැසීමේ දී ප්‍රාග්ධන වියදම් ඉහළ යයි. යම් කිසි ආයෝජනයක් හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීමත් සමඟ ම වැටුප්, බදුකුලී, පොලී හා ලාභ යනාදි සාධක, ලෙසින් ස්වරූපයෙන් මිනිසුන් අතට ආදායම් ගලා යයි. එහෙත් එම ආයෝජනවල ප්‍රතිලාභ භාණ්ඩ හා සේවා ලෙස ලැබෙන්නේ කාලයක් ගත වූ පසුව යි. ආයෝජන කාලය හා ප්‍රතිලාභ ලැබෙන කාලය අතර පරතරයක් ඇත. මේ නිසා දියුණු වන රටවල නිතර ම මුදල් සැපයුම භාණ්ඩ සැපයුමට වඩා වැඩි ය. මුදල් සැපයුමට සමානුපාතික භාණ්ඩ සැපයුමක් ඇති කිරීම මඟින් උද්ධමනය වළක්වා ගත හැකි නමුත් දියුණු වන රටවලට එය කළ නොහැකි ය. සංවර්ධන ව්‍යාපෘති දිගින් දිගට ම පවත්වා ගෙන යන හෙයින් ඉහත කී පරතරය ද අඛණ්ඩව පවතී. දියුණු වන රටවල උද්ධමනය නොවැළැක්විය හැකි දෙයකි. (ලකුණු 10 යි.)

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10 යි.**

| | | |
|---|---|---|
| අන්තර්ගතය | : | ප්‍රධාන අදහස් සඳහා ලකුණු 06 යි. |
| වචන ගණන | : | ලකුණු 02 යි (වචන 50 - 55 අතර තිබීම සඳහා) |
| ශිල්පීය දක්ෂතා | : | ලකුණු 02 යි (ව්‍යාකරණ, අක්ෂර, විරාම ලක්ෂණ ආදිය) |

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

අපේක්ෂිත ප්‍රධාන අදහස්,

- රටක සංවර්ධනයේ දී ආයෝජන නිසා ඒක පුද්ගල ආදායම ඉහළ යයි.
- ජනගහන වර්ධන වේගය අනුව සමාජ පිරිවැය වැඩි වෙයි.
- කර්මාන්ත සහ ව්‍යාපාර හේතුවෙන් ප්‍රාග්ධන වියදම් ඉහළ යයි.
- ආයෝජනවලින් ප්‍රතිලාභ ලැබුණත් ඒ සඳහා කාලයක් ගත වෙයි.
- සංවර්ධනය වන රටවල මුදල් සැපයුම භාණ්ඩ සැපයුමට වඩා වැඩි වීමෙන් උද්ධමනය ඇති වෙයි.
- සංවර්ධන ව්‍යාපාර අඛණ්ඩව පැවතීම නිසා උද්ධමනය වළක්වාලිය නොහැකිය.

වචන ගණන 60 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 55 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන ගණන 45 ට අඩු වන කල්හි වැඩි අගයක් ලැබෙන සේ ප්‍රධාන අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් දෙන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී බිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 60 ට වැඩි වන කල්හි හෝ 45 ට අඩු වන කල්හි වචන ගණන සඳහා 01 (එක) ලකුණක් පිරි නමන්න.

ප්‍රශ්න අංකය - 04

අපේක්ෂණය - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම.

4. පහත දැක්වෙන ඡේදය කියවා, එයින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.

විද්‍යාව මනුෂ්‍ය සංහතියට සාධාරණ වූ දායාදයක් වන අතර ජාතික දායාදය වශයෙන් සැලකිය යුත්තේ භාෂාව, සාහිත්‍යය හා ශිල්පයන්, ඒවා සමග අනිවාර්යයෙන් අත්වැල් බැඳගෙන ඇති චාරිත්‍ර වාරිත්‍රයන් ය. විද්‍යා විෂයයෙහි නම් [illegible] පැනනැගුණු මතිමතාන්තර තිබේ. එහි [illegible] ඉදිරියට [illegible] ඒවා අපේ [illegible] ගන්නේ ය. ආහාර නිෂ්පාදනය, පෝෂණය, වාසස්ථාන, යාන වාහන ආදිය සම්බන්ධයෙන් නවීන විද්‍යාවේ පිහිට සොයා අපේ ජනතාව සුඛිත මුදිත කිරීම එක්තරා විදියක ජාති වාත්සල්‍යයකි. එහෙත් ඒ [illegible]. ජීවිතයේ ජාතියක අනන්‍යතාව ද රැක ගත යුතු ය. ආරෝග්‍යශාලා හැම රටකට ම පොදු ය. [illegible] යානා නැව් ජාතියකට ම අයිති ය. බොරොබුදූරය, ලූවර්, [illegible] වැනි වෙනත් දේ [illegible] තිබේ. එහෙත් [illegible] ජාතික [illegible] ඒ ජාතියේ සංස්කෘතිය නිසා ය. මෙසේ [illegible] ජාතික ලක්ෂණයක් කොට සැලකිය [illegible] පවතී.

(i) මේ පාඨයේ මූලික තේමාව කවරේ ද?
(ii) ජාතික දායාදයන් වශයෙන් මෙහි දක්වා ඇත්තේ කුමක් ද?
(iii) ජනතාවගේ සුඛිත මුදිත භාවය සඳහා දියුණු කළ යුතු ලෙස ලේඛකයා දක්වා ඇති කරුණු මොනවා ද?
(iv) ජාතියක අනන්‍යතාව හා සංස්කෘතිය අතර පවතින සම්බන්ධතාව මේ ලේඛකයා දකින්නේ කෙසේ ද?
(v) පහත සඳහන් යෙදුම්වල අදහස පැහැදිලි කරන්න.
(අ) අත්වැල් බැඳගෙන (ආ) පැනනැගුණු මතිමතාන්තර (ලකුණු 10 යි.)

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10 යි.
ප්‍රශ්න අංක (i) සිට (iv) තෙක් ලකුණු 02 බැගිනි.
(v) ප්‍රශ්නය සඳහා කොටසකට ලකුණු 01 බැගින් ලකුණු 02 යි.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**අපේක්ෂිත උත්තර**

I ජාතියේ අනන්‍යතාව සංස්කෘතියෙන් පිළිබිඹු වන බව/ ජාතියේ අනන්‍යතාව හා සංස්කෘතිය අතර සම්බන්ධතාව
(සමාන අදහසක් උත්තරය සේ ලියා ඇත්නම් පිළිගන්න.)

II භාෂාව, සාහිත්‍යය, කලා ශිල්ප හා ඒවා සමඟ බැඳුණු චාරිත්‍ර වාරිත්‍ර

III ආහාර නිෂ්පාදනය, සෞඛ්‍යය, වාසස්ථාන හා යාන වාහන

(කරුණු 04 ට ලකුණු 04, කරුණු 03 ට ලකුණු 01, කරුණු 03 කට අඩු නම් ලකුණු 0 යි)

Iv අවියෝජනීය සම්බන්ධතාවක්/ අනුලෝම සම්බන්ධයක්/ වෙන් කළ නොහැකි සම්බන්ධයක්/ නොවෙනස් සම්බන්ධයක්
(සමාන අදහසක් උත්තරයක් සේ ලියා ඇත්නම් පිළිගන්න.)

V (අ) එකට එකතු වී/ එකමුතු වී/ එකට බැඳී පවතින
(ආ) කාලයට නොගැළපෙන අදහස්/ ~~නොගැළපෙන අදහස්~~/. කාලයට අදාළ නොවන අදහස්

**ප්‍රශ්න අංකය - 05**
**අපේක්ෂිතය - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂාගය සඳහා කුසලතා ඇගයීම.**

5\. සිදුවෙන් පැතිර යන ඩෙංගු උණ රෝගයෙන් මහජනතාව බේරා ගැනීම ජාතික අවශ්‍යතාවකි. ඔබ ප්‍රදේශයෙහි ඩෙංගු මර්දන ව්‍යාපාර කමිටුවේ ලේකම්වරයා ඔබ යැයි සිතා, මෙම රෝගය ගැන මහජනතාව දැනුවත් කිරීම පිණිස **අත් පත්‍රිකාවක්** සකස් කරන්න. රෝගය වැළඳීමේ හේතු හා එය වළක්වා ගැනීමට ගෙදිය යුතු උපාය මාර්ග, රෝගයෙන් සිදුවන හානිය, රෝගියකු බේරා ගැනීමට ගත යුතු ඉදිරි ක්‍රියා පිළිවෙළ යන කරුණු ඔබ සකස් කරන අත් පත්‍රිකාවෙහි අඩංගු විය යුතුය. (වචන 100 ක් පමණ සැළේ.)

**නැතහොත්**

ප්‍රධාන පෙළේ ප්‍රකාශන ආයතනයකට කළමනාකරණ සහකාරවරයකු බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකළ යුතුව ඇත. එම ආයතනයේ පිරිස් කළමනාකරු ඔබ යැයි අදහස් කොට, **පුවත්පත් දැන්වීමක්** සකස් කරන්න. ඔබ සකස් කරන දැන්වීමෙහි ආයතනයේ ලියාපදිංචි නාම, බඳවා ගැනීමට නියමිත තනතුර, අවශ්‍යතා සුදුසුකම්, වෘත්තීය හා වෙනත් අදාළ සුදුසුකම්, වයස, වැටුප, ඉල්ලුම් පත්‍රය යැවිය යුතු ක්‍රමය, අවසාන දිනය, පිරිස් කළමනාකරුගේ ලිපිනය යන කරුණු ඇතුළත් විය යුතු ය. (වචන 100 ක් පමණ සැළේ.)

(ලකුණු 15 යි)

* * *

**අත් පත්‍රිකාව**

**ලකුණු විභජනය - මුළු ලකුණු 15 යි.**

| | | | |
|---|---|---|---|
| 1. | ආකෘතිය සඳහා ලකුණු | - | 04 |
| 2. | අන්තර්ගතය සඳහා ලකුණු | - | 08 |
| 3. | ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු | - | 03 |

1\. ආකෘතිය - (ලකුණු 04 යි)

- මාතෘකාව — ලකුණු 01 යි
- දැනුම් දෙන්නාගේ තනතුර — ලකුණු 01 යි
- ලිපිනය හා දිනය — ලකුණු 01 යි (කරුණු දෙකම අවශ්‍යයි)
- නිර්මාණාත්මක බව — ලකුණු 01 යි

www.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

2. අන්තර්ගතය සඳහා - (ලකුණු 08 යි)

- රෝගය වැළඳීමේ හේතු - ලකුණු 02 යි
- වළක්වා ගැනීමට යෙදිය යුතු උපාය මාර්ග - ලකුණු 02 යි
- රෝගයෙන් සිදුවන හානිය - ලකුණු 02 යි
- රෝගියෙකු බේරා ගැනීමට ගත යුතු නිවැරදි ක්‍රියා පිළිවෙළ - ලකුණු 02 යි

3. ශිල්පීය දක්ෂතා සඳහා (ලකුණු 03 යි)

* නිවැරදි අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ, විරාම ලකුණු, පැහැදිලි අකුරු උක්තාඛ්‍යාත සම්බන්ධය, ඡේද වෙන් කිරීම, සමස්තයක් සේ සලකා ලකුණු පිරිනමන්න.
* අදාළ කරුණු සංවිධානාත්මක හා නිර්මාණාත්මකව ඉදිරිපත් කර තිබිය යුතුයි. අදාළව තවත් කරුණු ලියා ඇත්නම් ඒවා ද පිළිගන්න.

( ලකුණු 15 යි )

පුවත්පත් දැන්වීම.

1. ආකෘතිය - ලකුණු 04 යි
2. අන්තර්ගතය - ලකුණු 08 යි
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි

1. ආකෘතිය ( ලකුණු 04 යි )

- ආකර්ෂණීය ශීර්ෂය - ලකුණු 01 යි.
- නිර්මාණශීලී බව - ලකුණු 01 යි.
- දැන්වීම පළ කරන්නාගේ නම, ලිපිනය - ලකුණු 01 යි.
- දැන්වීම පළ කරන දිනය - ලකුණු 01 යි.

2. අන්තර්ගතය ( ලකුණු 08 යි )

- ආයතනයේ ලියා පදිංචි නම - ලකුණු 01 යි.
- බඳවා ගැනීමට නියමිත තනතුර - ලකුණු 01 යි.
- අධ්‍යාපන සුදුසුකම් - ලකුණු 01 යි.
- වෘත්තීය හා වෙනත් සුදුසුකම් - ලකුණු 01 යි.
- වයස - ලකුණු 01 යි.
- අපේක්ෂිත වැටුප - ලකුණු 01 යි.
- ඉල්ලුම් පත්‍රය එවිය යුතු පිළිවෙළ - ලකුණු 01 යි.
- ඉල්ලුම්පත් එවිය යුතු අවසාන දිනය - ලකුණු 01 යි.

* නියමිත වචන සංඛ්‍යාව ඉක්මවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අවුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

3. ශිල්පීය දක්ෂතා ( ලකුණු 03 යි )

නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම, ව්‍යාකරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් සේ සලකා ලකුණු පිරිනමන්න.

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන් ව දී ලකුණු එකතුව ලබා ගන්න.

( ලකුණු 15 යි )

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය III<br>Sinhala Language and Literature III | පැය දෙකයි<br>Two hours |

වැදගත්: උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.

* 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
  මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංකය - 01**

**අපේක්ෂණය - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම**

**ලකුණු විභජනය - මුළු ලකුණු 20 කි.**

**මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.**

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුප්‍රශ්නයකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "එසේ වී නම් කෙටි ම සිතූ ගිය කරා නැවතී ගෙන එව."
(අ) මෙම ප්‍රකාශය කිරීමට හේතු වූ කාරණය කුමක් ද?
(ආ) මෙහි සිතූ ලෙසින් හඳුන්වා ඇති අයගේ නම් ලියන්න.

(ii) "බලන්න මේ නුඹ දිහා හරියට පණේවින් වාගෙ"
(අ) මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?
(ආ) මෙම පාඨය උපුටාගත් කෙටි කතාවේ කතුවරයා කවරෙක් ද?

(iii) "**දියසෙමින් සැලෙනු පිනිකැට මෙන්** වියැ මෙදිනේ
ඉකිබිඳ පෙරෙද් වැටෙමි දෝ හිමි පදිනේ"
(අ) මෙම කවියේ මුල් පද **දෙක** සම්පූර්ණ කරන්න.
(ආ) තද කළ අකුරින් මුද්‍රිත කොටසින් ඇඟවෙන සිදුවීම කුමක් ද?

(iv) "මොකා ද මේ පැන්නෙ ප්‍රසාද සාලෙකින් නාවේ!"
(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද? (ආ) එය යොමු කළේ කවරකු ද?

(v) "ගැටවරු ගෙනා සිවුරු වැලඳගෙන පාත්‍රය සවටා ගෙන **දකුණු මුහුද සමින් ගත් හැටින් මෙන්** අහසින් අවුත් බිමට බැස ලා"
(අ) මෙම පාඨය උපුටා ගත් මුල් කෘතිය නම් කරන්න.
(ආ) තද කළ අකුරු සහිත කොටසින් උපමාවට ලක් කර ඇත්තේ කවුරුන් ද?

(vi) "ඇත්තට ම මේ නම් සිත්ත විස කෝප්පයක් නොවේ ද?"
(අ) මෙසේ සිතුවේ කවරකු ද? (ආ) සිත්ත විස කෝප්පයක් ලෙස හඳුන්වන ලද්දේ කුමක් ද?

(vii) (අ) සිවු පද ආකරෙන් රචිතව, දැනට දක්නට ඇති මුල් ම ජාතක කතා කාව්‍යය කුමක් ද?
(ආ) එම කාව්‍ය ග්‍රන්ථයේ රචකයා කවරකු ද?

(viii) "**සුදු** සඳ ලෙසට ඇත් පැටියෙක් විත් සතෙන්
**සුදු** යම් දෙයක් සිදුවෙයි මට ද්වි සිතේ"
එක් එක් කවි පදයේ තද කළ අකුරෙන් මුද්‍රිත වචනවල අදහස් වෙන් වෙන්ව ලියන්න.
(අ) සුදු (ආ) සුදු

(ix) (අ) සද්ධර්මරත්නාවලිය ලියන ලද්දේ කුමන භාෂාවක් ඇසුරු කර ගෙන ද?
(ආ) කාබුලිවාලා යන වෙනත් කතා නමැති පරිවර්තන කෘතිය ලියූ කතුවරයා කවරකු ද?

**(x) පහත සඳහන් ග්‍රන්ථ ලියැවුණු සාහිත්‍ය යුග නම් කරන්න.**
**(අ) පන්සිය පනස් ජාතක කතා පොත** (ආ) පූජාවලිය (ලකුණු 02 × 10 = 20 යි)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(i) (අ) බිම්බිසාර රජතුමා භගන්දරාබාධය සුවපත් කර ගැනීමට සිතූ අවස්ථාව
(ආ) ජීවක /

(ii) (අ) පත්මා මිස් සිරියාවතීගේ චිත්‍රය අඳින ලද අවස්ථාව
(ආ) මහාචාර්ය ඒ.වී. සුරවීර මහතා /

(iii) (අ) හිඳකින් පමණ පෙම් බැඳ සැප විඳ සොඳිනේ
බඹකින් වියරු වෙනසක් නොවැ ඉඳින දිනේ

(ආ) සිඳුරා හදිසියේ හී සතරට ලක් වීම/ ඇදහිය නොහැකි විපතක් සිදුවීම වැනි අදහසක්

(iv) (අ) සන්දාවතීගේ / තොපාසිස්ගේ දියණියගේ
(ආ) ලුවිසෝරිස් /

(v) (අ) සද්ධර්මරත්නාවලිය
(ආ) පසේ බුදුන් වහන්සේ

(vi) (අ) කථකයා / බාබු සහිබ් / බාබූජි
(ආ) කථකයා අභිබිරි අත්දැකීමකට / වංචාවකට / රැවටීමකට හසු වී යයි සිතීම

(vii) (අ) සඳකිඳුරු දා කව
(ආ) විල්ගම්මුල සංඝරාජ හිමි / විල්ගම්මුල හිමි

(viii) (අ) පුරපාට / ධවල / සිරිපාට
(ආ) යහපත් / සොඳ / ශුභදායක / සුබ

(ix) (අ) පාලි ධම්මපදට්ඨ කථාව
(ආ) ඩබ්ලිව්. ඒ. අබේසිංහ

(x) (අ) කුරුණෑගල යුගය
(ආ) දඹදෙණි යුගය

ප්‍රශ්න අංක - 02

WWW.OLEVELAPI.COM

අපේක්ෂණය 1. නිරවද්‍ය පාඨ පිළිබඳ අවබෝධය
2. පාඨයක අදහස තම බසින් ලියා දැක්වීමේ කුසලතාව ඇගයීම

ලකුණු විභජනය - ප්‍රශ්නයකට හිමි මුළු ලකුණු 20 යි.
(එක් කොටසකට ලකුණු 05 බැගින්)

තද කළු අකුරින් ඇති එක් එක් වචනයට නිවැරදිව තේරුම් ලියා පැන්නම් එක් වචනයකට
ලකුණු 01 බැගින් — ලකුණු 02 යි
සමස්ත අර්ථයට — ලකුණු 03 යි

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළ අකුරින්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිඛිත බසින් ලියන්න.

(i) "එක් වේලෙක අනුභව කළ දෙය එක් වේලක හැරා පියා ජීවිතය රක්ෂා කෙරෙති. එසේ සිටිනාහෝ **ශුෂ්ක කාෂ්ඨයක්** සේ වියළි දවසින් දවස **පඬුවන්** ම සියහ."

(ii) "නිධාන නම් රජ දරුවන් **සන්තක** බව නොදනු ද? කිමෙක් ද? තොපි හලාහල විෂටත් වඩා උග්‍ර වූ **වර්ගවිනාශයට** කාරණ වූ නිධාන තමාගෙන ප්‍රයෝජන විඳු දැයි කියා භය ගන්වා මරන්නී."

(iii) "අසත් බෝසතුන් ළෙයි සාමිනි විමසා
මදත් පැලී පැලී පණනල සිඳෙනා සියා
**පසක් තෙදැති** දෙවියන් පදිමින් හොලසා
**තැසක් සත්හලවු** බස් ගොදලයි මෙලෙසා"

(iv) "සතුටු ව උදන් ගී කිය කියා තමා හා **ඒකාත්මිකවූ මිත්‍රපුත්‍රකලත්‍රාදීන්** හා පරිවාර ජනයන් පිරිවරා නිත්‍යෝත්සවයෙන් සිත සිතා කොයෙන් කෙළි කරයෙයි නිරුපද්‍රව වූ සැපසේ වසන්නාහු ම ය." (ලකුණු 05 × 04 = 20 යි)

අපේක්ෂිත උත්තරය

I ශුෂ්ක කාෂ්ඨයක් - වියළි කෝටුවක්/ වියළි දණ්ඩක්/ වියළි දර ලීයක්/
පඬුවන්ව - සුදුමැලිව/ සහ පැහැව/ පඬු පැහැය/ දුර්වර්ණ

"එක් වේලක් ආහාරයට ගත් දෙයින් තවත් වේලක් වමාරා ජීවිතය ආරක්ෂා කෙරෙති. එවිට සිටිනාහු වියළි දරකෝටුවක් මෙන් වියළි දවසින් දවස සහ පැහැ වූහ".

II සන්තක - අයත් / සතු / අයිති / හිමි
වර්ග විනාශයට - පරම්පරාවේ විනාශයට / පරපුරේ විනාශයට

"නිධාන රජවරුන්ට අයත් බව නොදන්නේ ද ? කුමක් ද ? තොප හලාහල නමැති (ඉතා උග්‍ර) විෂටත් වඩා දරුණු වූ තම පරපුරේ විනාශයට හේතු වූ නිධාන තමා ගෙන ප්‍රයෝජන ගත්තේ දැයි කියා භය ගන්වා සියත්හී".

III පසක් තෙදැති - ප්‍රත්‍යක්ෂ වූ තේජස ඇති / සත්‍යවශයෙන් ම තේජවන්ත
තැසක් සත්හලවු ඛබොහෝ ඇවිටිලි / ඉවරයක් නැති ඇවිටිලි / අඳෝනා/

බොහෝ ආයාචනා / බොහෝ යාඥා

"බෝසතුන්ගේ පපුවෙහි අතක් තබමින් විමසා හැකි ගැසී ප්‍රාණවායුව සිඳෙන බව දැන ප්‍රත්‍යක්ෂ වශයෙන් තේජස් ඇති දෙවියන්ට අහලස් ව බොහෝ ඇවිටිලි බස් මේ ආකාරයට පවසයි".

IV ඒකාත්මික - ආත්මීය වශයෙන් බැඳුණු / එකම ආත්මයක් බවට පත් වූ
මිත්‍රපුත්‍රකලත්‍රාදීන් - මිතුරන් දරුවන් අඹු (භාර්යා) ආදීන්/

"සතුටින් ප්‍රීති වාක්‍ය කියමින් තමා සමඟ ආත්මීය වශයෙන් බැඳුණු මිතුරන්, දරුවන් අඹු (භාර්යා) ආදීන් සහ පිරිවර ජනයා හා එක්ව නිරන්තර සතුටින් කුල්මත්ව එවැනි ක්‍රීඩා කාටයෙහි නියැළී සැපසේ වාසය කරති".

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

ප්‍රශ්න අංක - 03 - 07 තෙක්

අපේක්ෂණය - අගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව අගයීමට ලක් කිරීම.

ලකුණු විග්‍රහය - 3, 4 ප්‍රශ්න අනිවාර්යයි ලකුණු 15 යි

5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතුය. ලකුණු 10 යි

3, 4 ප්‍රශ්නවල තෝරා ගත් ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් වෙන් වෙන් ව විස්තර සහිතව ලියා තිබිය යුතුය උදාහරණ දක්වමින් එක් පිළිතුරක් සේ ලියා තිබුණ ද ලකුණු දෙන්න.

උදාහරණ 04 ට - ලකුණු 04 }
සමස්ත විස්තරයට - ලකුණු 11 } ලකුණු 15 යි

ප්‍රශ්න අංක 03

3. උත්තරෝලිය විස්තර රසවත් කතා පුවතක් ලෙස අගය කළ හැක්කේ,
(i) උචිත රචනෝපක්‍රම යොදා ගැනීම
(ii) විශ්වසනීයත්වය කොඩිනැගෙන ලෙස ඉදිරිපත් කිරීම
යන කරුණු නිසා ය. එම කරුණුවලට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

අපේක්ෂිත උත්තරය

3. I උචිත රචනෝපක්‍රම.
- උපමා
  - සංසාර නමැති සාගරේ
  - ජාති ජරා ව්‍යාධි මරණ නමැති මහත් වූ රළ පහර බිඳිමි ඇති.
  - ලෝභ ද්වේෂ මෝහ මදමාන මාත්සර්ය නමැති චණ්ඩ පරශ මකර සුංසුමාරාදීන් විසින් ගැවසීගත්තා වූ
  - ශෝප නමැති කිහි ගත්තා වූ
  - මාතුගාම නමැති උදක රාක්ෂසීන්ට වාසස්ථාන වූ
- කෙටි වැකි
  - "සමහර වේලෙක දියෙහි ගිලෙයි. ඉපිලෙයි".
  - "එකල ඒ නිධානය මදක් පැන් ඇවිත් ඉදිරියේ සිට ගත".
  - "රාජ පුරුෂයෝ ඒ නිධානයෙහි පවත් රජ හට කියා යැවූහ".
- දිගු වැකි
  - "එසේ හෙයින් යමෙක් සීලාදී ගුණ ධර්මයන්ට පරම ප්‍රතිෂ්ඨාධාර වූ බුදුන් දරු සුවිලිපත් ............".
- අනුප්‍රාස ඇතුළු ශබ්ද ධ්වනි ඉදිරිපත් කිරීම.
  - ඒ නිධානය සියල්ලවුන්ට පෙනෙන සේ උතුරාලූ වැව දියපිට පෙරැළි පෙරැළි ඔබමොබ දිවෙයි. සමහර වේලෙක දියෙහි ගිලෙයි ඉපිලෙයි.
  - ඒ දැක මනුෂ්‍යයෝ වෙන වෙනම අප ළඟට එවයි. අපගේ පිනෙක් ඇත්නම් අප ළඟට එවයි කිය කියා සිටියාහ. ඒ කුමාරයාගේ මව ද එසේ කිය කියා සිටියාහ.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- සංස්කෘත වචන බහුලව යෙදීම.
  - ශික්ෂාග්‍රහණ කාලය සම්ප්‍රාප්ත විය.
  - මාතෘගාම සමඟිනි උදක රාක්ෂසින්ට
  - රූප ශබ්දාදි පංචකාම කොට්ඨාස
  - දිව්‍ය මනුෂ්‍යසම්පත්ති සඞ්ඛ්‍යාත සප්තරත්නමය වූ කොසොවෙසින්

II විශ්වසනීයත්වය ගොඩනැගෙන ලෙස ඉදිරිපත් කිරීම.

- දිළිඳු ගොපලු දරුවාට සැමට කටු අලයක් දීම.
- නිධානය බැලීමට ගම්වැසියන් පැමිණීම.
- නිධානය අත්පත් කර ගැනීමට ගම්මුන් උත්සුක වීම.
- රජ දරුවන් සන්තක දෙය සොරාගත් විට අත්වන ඉරණම.
- එක් අයෙකුට නිධානය ලැබීම නිසා අන් අය ඊර්ෂ්‍යා කිරීම.
- රාජ ගෞරවයට පාත්‍ර වී සැප සම්පත් ලැබීම.

උදාහරණ 02 ට (04) ලකුණු 04 යි.
සමස්ත වස්තුවට ලකුණු 11 යි.

(ලකුණු 15 යි)

සැසඳෙන්

කාව්‍යශේඛර කතුවරයා,

(i) බමුණු සමාජය උපහාසයට ලක් කිරීම

(ii) උචිත අවස්ථා පණිඩසේ තෝරා ගැනීම

ඉතා මැනවින් කර ඇති බව පෙනේ. නියමිත කොටසින් උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

WWW.OLEVELAPI.COM

I බමුණු සමාජය උපහාසයට ලක්කිරීම

- සහවණු දහසකින් සෑහීමට පත්නොවී තවදුරටත් වස්තුව සිතාසෑම

  බමුණු ඒ දහස ගත් ........

- අනුන්ගේ ධනය වියදම් කිරීම

  සබඳු වියදම් සිතූ මතකට

- මහලු වී තරුණ අඳුන් පැටීම

  එළඳ දැක මහලු කර මදහස

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

II උචිත අවස්ථා පමණක් තෝරාගැනීම

- ධනය මිසුරා ලන තබායෑම
  බමුණු ඒ දහස ලත්
- ආපසු පැමිණ මුදල් ඉල්ලීම
  ඇවිදින් දද මහලු
- මුදල් දීමට නොහැකි බව පැවසීම
  නුවෙන් අප අයැති
- නිලුව්වට දුව සරණ පාවා දෙන බව පැවසීම
  සිලුව් කොට ඒ යලි වසෙක් ඇති
- මහලු බමුණා වයට වසඟ වීම
  සොඳයි පුවා ගනිමි මහකලු

| | |
|---|---|
| උදාහරණ සඳහා | ලකුණු 04 යි. |
| සමස්ත විස්තරයට | ලකුණු 11 යි. |

(ලකුණු 15 යි)

මෙම උදාහරණ හෝ වෙනත් උචිත කරුණු දක්වා ඇත්නම් අදාළ ලකුණු දෙන්න.

ප්‍රශ්න අංක 04

4. "අපටත් දරුවකු ඉර පායාවිද" කෙටි කතාව තුළින් කතුවරයා උත්සාහ කොට ඇත්තේ,
   (i) දිළිඳු සමාජය පත් ව ඇති පීඩාකාරී වාතාවරණය
   (ii) ධනවත් සමාජය අනුකූල ලෙස [illegible] ලබන [illegible] උත්සාහය
   යන කරුණු අතරට මැදි වන දරුවකුගේ සංවේදී හැඟීම් විස්තර කිරීමට ය. එම කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

WWW.OLEVELAPI.COM

අපේක්ෂිත උත්තරය

I

- පසුවදා සෙයිලමට යන්නේ සාගෙන් හරි සල්ලි ඉල්ලා ගෙන
- සෝමා අයදලා ඉවර වෙනකල් මං බලාගෙන හිටියේ පාට කූරක් ඉල්ලා ගන්නයි.
- මේ පොඩි එකාගේ පිරි ඉවර වෙලා .............. මං දෙයියන්නාන්සේට කිය කියා හිටියේ බොට පාට
- මැනිප්‍රැන්තතා ලඟ තාල් පොතක් කියලා යෙනාලව ඒක ලණු වපත් වනුගලාටත් බේරගන්නවා.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

II

- එරෙන්ටර් මගේ තත්වත් බව ඔයා දන්නවද්ද?
- මට ජෝන්සිය කලින් කියලා තිබුණත් මෙහෙම කරපු එකට ………. හැබැයි වැඩිකල් කරන්නාවත්නෑ
- එනසිංහ විවර් තනියමත් අපේ මිස්ට බැන්නා
- එනසිංහ විවර් දක්සිනේ ………….. අතින් අල්ලාගෙන ආව් කාමරේ පැත්තට යනවා …………
- අසරණ අපට ඔය පර්වත එක්ක හැප්පෙන්න බෑ.

උදාහරණ සඳහා ලකුණු 04 යි.
සමස්ත විස්තරයට ලකුණු 11 යි.

(ලකුණු 15 යි)

මෙම උදාහරණ හෝ වෙනත් උචිත කරුණු දක්වා ඇත්නම් අදාළ ලකුණු දෙන්න.

නැතහොත්

විදුල් ප්‍රස්තාව නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇත්තේ,

(i) කුතුහලය ජනනය වන අවස්ථා ඉදිරිපත් කිරීම

(ii) හාස්‍යය සහ තිත්තමු යන්නා උත්සාහය

යන කරුණු ය. නාට්‍යයේ සොඳ ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.(ලකුණු 15 යි)

**අපේක්ෂිත උත්තරය**

I ලුවිහේරිස් තොපාසිස්ගේ නිවසට පැමිණීම

- අද මොකද මේ හැටි උදාරුවට මේ ළමයා ඇඳ පැළඳ ගෙන එහෙම ?
- ලුවිහේරිස් හමුවීමට සන්දාවනී පැමිණීම
  තාත්තා කිව්වේ ඔබු වතුයේ නන්න කවුරෝ මුදලාලි කෙනෙක් ඇවිල්ලා ඉන්නවයි කියලා
- වල්ලියා සහ සඳයා පිළිබඳ ඇති වූ කතාබහ
- ලුවිහේරිස් මියගොස් ඇතැයි සිතා කෙරෙන ප්‍රකාශ

II

- තොපාසිස්ගේ නිවසට පැමිණි ලුවිහේරිස් හැසිරෙන ලැජ්ජාශීලී ස්වභාවය හා සරල කතා බහ
- පැමිණි කාරණය අමතක කොට වෙනත් කරුණු කතාකිරීම
- විවිධ ඕපාදූප ඔස්සේ රණ්ඩු කරමින් සිට හැරුණු බව සිතා ලුසිබිඳ හැඬීම
- හදිසියේම විවාහය සිදුකිරීමට තීරණය කිරීම

උදාහරණ අවස්ථා සඳහා ලකුණු 04 යි.
සමස්ත විස්තරයට ලකුණු 11 යි.

( එකතුව 15 යි)

මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන කරුණු ඉදිරිපත් කර ඇත්නම් අදාළ ලකුණු දෙන්න

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**ප්‍රශ්න අංක - 05**

5. 'වැස්ස නිසා පරිසරයේ ඇති වන සුවිශේෂතා ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා කවියා දක්වන්නේ අපූර්ව කුසලතාවකි.' වැස්ස කවිපෙළ ඇසුරෙන් උදාහරණ තුනක් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

**අපේක්ෂිත උත්තරය**

වැසි අවස්ථාවක දී දක්නට ලැබෙන දර්ශන ඉදිරිපත් කිරීම.

- අහසේ වළාකුළු හා තරඟයක යෙදී
- පදමට වෙරළ්මිනිසාට පුළු විසුළ හැඩ
- දිය වැල් වමාරන්නා මෙහි සියසි තල
- පිඹුරන් සේ ඇදෙයි ගුරු පැහැ දිය දාරා
- තස්වැල් හිසැස්සෙයි මේ කුළු ගැටෙන තඩින්
- ඇළ දොළ කලා බස්වන්නට ඉවුරු සැඩා
- මිදුලේ පුංචි ගංගාවල් මිණිවෙන කල

වැසීත විට ස්වභාවික වස්තු මෙන්ම සජීවී සත්ත්වයින්ද දක්වන ප්‍රතිචාර

- "හැපැ පුංචු මහත්කොට මී ගොන් මුළුව තැඩ"
- "මට මහ සොම්නසක් ඇත මොනරෙකුට වඩා"
- "සිතුවිලි වලට මුව් හදවතම ඉඩ මදි"
- "පාසල් ළමයි පාවෙති සිය සිහින වල"

| | | |
|---|---|---|
| උදාහරණ සඳහා | ලකුණු | 03 යි. |
| සමස්ත විස්තරයට | ලකුණු | 07 යි. |

( ලකුණු 10 යි)

මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන කරුණු ඉදිරිපත් කර ඇත්නම් අදාළ ලකුණු දෙන්න.

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**ප්‍රශ්න අංක : 06**

6. ශ්‍රද්ධා සහිතියෙන් දෙන ඉතා සුළු දානයක් වුවත් මහත්ඵල මහානිසංස ලබාදෙන බව [illegible] කතාව විදහා දක්වමින් [illegible] සද්ධර්මාලංකාරයේ [illegible] උපුටා පුළුස් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

**අපේක්ෂිත උත්තරය**

**කටු අලය දන්දුන් දරුවා වෙනුවෙන් ඊළඟ ආත්මභාවයේ දී**

- නිධානයක් පහළ වීම.
- එම නිධානය ඔහුට පමණක් භුක්ති විඳීමට හැකිවීම.
- රජතුමාගෙන් නොයෙක් සැප සම්පත් ලැබීම.
- ආයු කෙළවර දෙව්ලොව ඉපදීම හා දිව්‍ය සැපසම්පත් ලැබීම
- පිනෙන් ලැබෙන ආනිසංස කිසිවකුට පැහැරගත නොහැක.

ඉහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් උදාහරණ 3ක් වත් විස්තර කර ඇත්නම් ඉහළ ලකුණක් ප්‍රදානය කරන්න. පොතේ උපුටන ඒ ආකාරයෙන්ම පැහැත් විස්තර කර ඇත්නම් ලකුණු පිරිනමන්න.

| | |
|---|---|
| උදාහරණ අවස්ථා සඳහා | ලකුණු 03 යි. |
| සමස්ත විස්තරයට | ලකුණු 07 යි. |

( එකතුව ලකුණු 10 යි)

**ප්‍රශ්න අංක - 07**

7. "ස්වාර්ථය පමණක් ප්‍රාර්ථනය කරන්නා මහත් වූ ව්‍යසනයන්ට මං පෙත් විවර කර දෙන අයුරු සිත් සසළවන ආකාරයෙන් නියාපෑමට ගත් සාර්ථක උත්සාහයක් ලෙස වේදබ්භ ජාතකය අගය කළ හැකි ය." උදාහරණ **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10 යි)

※ ※ ※

**අපේක්ෂිත උත්තරය**

- වේදබ්භ බමුණා සොරුන්ගෙන් මිදීමේ අරමුණින් සොරුන්ට වස්තුව ලබාදීම නිසා විනාශයට පත්වීම.
- දෙවන සොරු කණ්ඩායම වස්තුව ලබා ගැනීම සඳහා පළමුවන සොරු කණ්ඩායම විනාශයට පත් කිරීම.
- දෙවන සොරු කණ්ඩායමට වස්තුව අත්කර ගැනීම සඳහා ඔවුනොවුන් විනාශ කිරීම.
- අවසානයේ වස්තුව හිමිකරගත් සොරුන් දෙදෙනා ද වස්තුව තනි තනිව හිමි කර ගන්නට ඔවුනොවුන් විනාශ කිරීම.
- ස්වාර්ථය පතන්නා තමාට හිතවත් වූ අයෙකු දෙන අවවාද පවා නොතකා හැරීම.
- ස්වාර්ථය පතන්නා බුද්ධිමත්ව සිතා බලා කටයුතු නොකිරීම.

(ඉහත කරුණු අනුව සිද්ධි විකිණෙන ගලපා ඉදිරිපත් කර තිබීමත්, කතා සන්දර්භයේ ඇති සුවිශේෂීබව විස්තර කර තිබීමත් අවශ්‍ය ය.)

| | |
|---|---|
| උදාහරණ අවස්ථා සඳහා | ලකුණු 03 යි. |
| සමස්ත විස්තරයට | ලකුණු 07 යි. |

WWW.OLEVELAPI.COM

( එකතුව ලකුණු 10යි)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...